# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2370/08 – 2024 පෙබරවාරි මස 06 වැනි අඟහරුවාදා – 2024.02.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**සමථ මණ්ඩල කොමිෂන් සභාව**

සමථකාරවරුන් ලෙස පත්කිරීම සඳහා නාමයෝජනා කැඳවීමේ නිවේදනය

2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 4(1) වැනි වගන්තිය මගින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් 2022.01.06 දිනැති අංක 2261/68 දරන *අතිවිශෙෂ ගැසට්* නිවේදනයේ අන්තර්ගත රජයේ ඉඩම් සහ පෞද්ගලික ඉඩම් සම්බන්ධ ආරවුල් නිරාකරණය කිරීම සඳහා පහත දැක්වෙන ප්‍රදේශ තුළ විශේෂ සමථ මණ්ඩල (ඉඩම්) වෙනුවෙන් සභාපති හා සමථකාරවරුන් පත්කිරීමට නාමයෝජනා කැඳවනු ලැබේ.

**විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය**

බදුල්ල දිස්ත්‍රික්කය
කළුතර දිස්ත්‍රික්කය
කෑගල්ල දිස්ත්‍රික්කය
පුත්තලම දිස්ත්‍රික්කය
ගාල්ල දිස්ත්‍රික්කය
මාතලේ දිස්ත්‍රික්කය
නුවරඑළිය දිස්ත්‍රික්කය
මොනරාගල දිස්ත්‍රික්කය
මාතර දිස්ත්‍රික්කය

1A – PG6639 – 31 (2024/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. එකී විශේෂ සමථ මණ්ඩල සඳහා සමථකාරවරුන් පත් කිරීම පිණිස පහත 02 (I) යටතේ සඳහන් සුදුසුකම් ඇති තැනැත්තන්ගේ නම් ඉදිරිපත් කරන ලෙස මෙහි පහත සඳහන් කර ඇති 02 (II) හි (අ) පුද්ගලයින්ගෙන් (ආ) මණ්ඩලවලින්, දේශපාලනමය නොවන සංවිධානවලින් සහ ආයතනවලින් හා (ඇ) දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් / ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් සමථ මණ්ඩල කොමිෂන් සභාව මෙයින් ඉල්ලා සිටී.

(I) යම් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයකට, පත්වීමක් ලැබීමට හිමිකම් ඇත්තේ පහත සඳහන් තැනැත්තන්ට බැවින්, ඔවුන්ගේ නම් පමණක් පත්වීම පිණිස යෝජනා කළයුතු වේ. එනම්,

(අ) විශේෂ සමථ මණ්ඩලවල සමථකරුවන්ගේ මූල මණ්ඩලයක සාමාජිකයෙකු ලෙස පත්කිරීමට සුදුසුකම් ලබන තැනැත්තෙකු වයස අවුරුදු 35ට වැඩි සහ අවුරුදු 70ට අඩු
(ආ) යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද පිළිගත් වෘත්තිය ආයතනයකින් ලබාගත් වෘත්තිය සුදුසුකම් සහිතව
(ඇ) රාජ්‍ය සේවයේ නිලධාරියකු වශයෙන් සේවය කර ඇති හෝ සේවය කරමින් සිටින තැනැත්තෙක් විය යුතුය.

(II) (අ) යම් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා තමන්ගේ ම හැර අන් අයගේ නාම ඉදිරිපත් කිරීමට පහත සඳහන් පුද්ගලයින්ට හිමිකම් ඇත්තේ ය.

(I) එම විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි කාර්යාලයක නියුතු දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු හෝ ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වන රාජ්‍ය නිලධාරියෙකුට හෝ පළාත් සභා රාජ්‍ය නිලධාරියෙකුට,
(II) එම විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පිහිටි ආගමික පූජනීය ස්ථානයක හෝ පාසලක ප්‍රධානියෙකුට,
(III) එම විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පදිංචිව සිටින විශ්‍රාමලත් දෙපාර්තමේන්තු හෝ පාඨශාලා ප්‍රධානියෙකුට,

(ආ) යම් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත්කිරීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට පහත සඳහන් මණ්ඩලවලට, සංවිධානවලට සහ ආයතනවලට හිමිකම් ඇත්තේ ය.

(I) යටත් පිරිසෙයින් අවුරුදු පහක් තිස්සේ පවත්නා වූද, පහත සඳහන් අරමුණු එකක් හෝ වැඩි ගණනක් ඉටු කරන්නා වූ යම් මණ්ඩලයකට, සංවිධානයකට හෝ ආයතනයකට,

(අ) සමාජයේ අධ්‍යාපනික, ආගමික, සදාචාරාත්මක හෝ ආධ්‍යාත්මික වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා
(ආ) සමාජ සුභසාධනය වර්ධනය කිරීම හෝ දුගී බව තුරන් කිරීම සඳහා
(ඇ) ග්‍රාමීය හෝ ප්‍රජා සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා
(ඈ) සංස්කෘතික හෝ ක්‍රීඩා වැඩිදියුණු කිරීම සඳහා සහ
(ඉ) සෞඛ්‍ය, ආහාර හා නිවාස වැනි ජනයාගේ මූලික අවශ්‍යතාවන් සැලැස්වීම සහ සපයා දීම අරමුණු කරගත් ව්‍යාපෘති, වැඩසටහන් සහ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා

(ඇ) යම් විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට / ප්‍රාදේශීය ලේකම්වරුන්ට හිමිකම් ඇත්තේ ය.

(II) එම විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා තිබෙන පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරුන්ට

03. (අ) ඉහත 2 වැනි ඡේදයේ සඳහන් වන පුද්ගලයින්, මණ්ඩල, සංවිධාන සහ ආයතනවලට 2 (අ) සහ (ආ) ඡේදවල දක්වා ඇති රාජ්‍ය නිලධාරින්ගේ නම් ඉදිරිපත් කිරීමට ඔවුන්ට හැකිවේ. කිසියම් පුද්ගලයෙකුට තමන්ගේ ම නම යෝජනා කර ගැනීමට නොහැක.
(ආ) ඉහත 2 (ඇ) ඡේදයේ සඳහන් කර ඇති දිස්ත්‍රික් ලේකම්වරුන්ට රාජ්‍ය නිලධාරින්ගේ නම් ඉදිරිපත් කළහැකි අතර, ඒ අයගෙන් පස් දෙනෙකුට නොවැඩි ගණනක් කොමිෂන් සභාව විසින් අදාළ සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත්කළ හැකිය.

04. නාමයෝජනා කිරීමේ ආකෘති පත්‍රය:

(අ) පුද්ගලයින් විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ පහත දැක්වෙන 'අ' ආකෘති පත්‍රයට අනුකූලවය.

(ආ) මණ්ඩල, සංවිධාන සහ ආයතන විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ආ' ආකෘති පත්‍රයට අනුකූලවය.

(ඇ) දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ඇ' ආකෘති පත්‍රයට අනුකූලවය.

එක් එක් නාම යෝජනාව වෙනම ආකෘති පත්‍රයක ලියා ඉදිරිපත් කළයුතු අතර, මීළඟ ඡේදයේ දක්වා ඇති පරිදි නාමයෝජනා ඉදිරිපත් කරන අයගේ නිර්දේශය ද නොවරදවාම එහි ඇතුළත් කළ යුතුය.

05. නාමයෝජකගේ නිර්දේශය හේතු රහිත නිර්දේශයක් නොවිය යුතුය. සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත් කිරීම සඳහා යෝජනා කරන තැනැත්තාගේ යෝග්‍යතාවය හෝ අයෝග්‍යතාවය පිළිබඳව සිය නිශ්චයට එළඹීමට කොමිෂන් සභාවට හැකිවන පරිදි නිශ්චිත කරුණු එම නිර්දේශයේ දැක්විය යුතුය. උදාහරණයක් වශයෙන් ඔහුගේ/ඇයගේ වර්තමාන හෝ කලින් රක්ෂාව, එම වෘත්තියේ සේවය කළ නැතහොත් යෙදී සිටි කාල පරිච්ඡේදය ඔහු/ඇය විසින් දරන ලද යම් විශ්වාස හෝ වගකීම් සහිත තනතුරක් හෝ ඔහු/ඇය විසින් යම් සමාජ සේවා, ආගමික පුණ්‍ය සංවිධානයක, සංගමයක, මණ්ඩලයක දරන ලද නිලය තිබේනම් එය ද සඳහන් කළ යුතුය.

06. කිසියම් පුද්ගලයෙක් හෝ මණ්ඩලයක්, සංවිධානයක් හෝ ආයතනයක් එකම සමථ මණ්ඩල ප්‍රදේශයක් සම්බන්ධයෙන් නාමයෝජනා තුනකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීමෙන් හැකිතරම් දුරට වැළකී සිටිය යුතුය. එහෙත් ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම් ට මෙම සීමාව අදාළ නොවේ.

07. සියලුම නාමයෝජනා 2024 මාර්තු 15 දිනට හෝ ඊට පෙර 4වන මහල, අධිකරණ අමාත්‍යාංශ ගොඩනැගිල්ල, අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 ලිපිනයේ පිහිටි සමථ මණ්ඩල කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන පරිදි එවිය යුතුය.

08. සම්මුඛ පරීක්ෂණයක් මගින් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් සමථකරණ දක්ෂතා සහ ක්‍රම පිළිබඳ ප්‍රාථමික පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යෝග්‍ය තැනැත්තන් තෝරා ගනු ඇත.

09. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද සමථ මණ්ඩල කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

**ටී. කේ. රත්නසූරිය**
ලේකම්,
සමථ මණ්ඩල කොමිෂන් සභාව.

2024 පෙබරවාරි මස 01 වැනි දින,
4 වන මහල,
අධිකරණ අමාත්‍යාංශ ගොඩනැගිල්ල,
අංක 19,
ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10,
සමථ මණ්ඩල කොමිෂන් සභා කාර්යාලයේ දීය.

'අ' ආකෘති පත්‍රය

(නාමයෝජනා ඉදිරිපත් කිරීමට සුදුසු පුද්ගලයින් විසින් පිරවීම සඳහා)

1. සමථ මණ්ඩල ප්‍රදේශය : .......................... .............................
2. පරිපාලන දිස්ත්‍රික්කය : .......................... .............................
3. නාමයෝජනාව ඉදිරිපත් කරන පුද්ගලයා පිළිබඳ විස්තර :

(අ) සම්පූර්ණ නම : ......................... ......................... .........................

(ආ) පදිංචි ලිපිනය : ......................... ......................... ........................

(ඇ) ඔබ නාම යෝජනාව ඉදිරිපත් කරන්නේ කුමන තත්වයෙන්ද යන බව : ................

(I) ඔබ දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
දෙපාර්තමේන්තුවේ නම : ......................... ......................... ................
රාජකාරී ලිපිනය : ....................... ......................... ............................
ඔබ දරන තනතුර : ......................... ......................... .........................

(II) ඔබ පූජනීය ස්ථානයක ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? නැතහොත් පාසලක ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
එහි නම : ......................... ......................... .............................
එහි ලිපිනය : ......................... ......................... .........................
ඔබ දරන තනතුර : ......................................................................

(III) ඔබ විශ්‍රාම ලත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් විශ්‍රාම ලත් පාඨශාලා ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
ආයතනයේ නම : ......................... ......................... .......................................
ඔබ විශ්‍රාම ගන්නා විට දරන ලද තනතුර : ...................... ......................
ඔබ පදිංචිව සිටින සමථ මණ්ඩල ප්‍රදේශය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) : ...................... .................

4. ඔබ විසින් නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර :

(අ) ඔහුගේ/ඇයගේ සම්පූර්ණ නම : ......................... ......................... ..................

(ආ) ඔහු/ඇය පදිංචි ලිපිනය : ......................... ......................... .........................

(ඇ) උපන් දිනය: ......................... ......................... ......................... .........

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය: ......................... ......................... .............

(ඉ) දුරකථන අංකය:......................... ......................... ............................

(ඊ) ඔහු/ඇය පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? .......................... .................

(උ) ඔහු/ඇය එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? ......................... ......................... .............

(ඌ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙකු ද? එසේනම් ඔහු/ඇය දරන තනතුර සඳහන් කරන්න.
...........................................................................

(එ) ඔබගේ නිර්දේශය ඊට හේතු ද සහිතව සඳහන් කරන්න. .................................

.............................
අත්සන
(මුද්‍රාව තිබේනම්)

දිනය : ..............................

## 'ආ' ආකෘති පත්‍රය

(නාමයෝජනා කිරීමට සුදුසුකම් ඇති මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ ලේකම් විසින් පිරවිය යුතුය.)

1. සමථ මණ්ඩල ප්‍රදේශය : .......................... ..............................
2. පරිපාලන දිස්ත්‍රික්කය : ........................................................
3. නාමයෝජනාව ඉදිරිපත් කරන මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය පිළිබඳ විස්තර :

   (අ) එහි නම : ......................... ......................... ..........................
   (ආ) එහි ලියාපදිංචි/රාජකාරි ලිපිනය : ......................... .......................... ...............
   (ඇ) එය ලියාපදිංචි කරන ලද හෝ පිහිටුවන ලද දිනය : .......................... ...................
   (ඈ) එය කොතරම් කාලයක සිට පැවතෙන්නේ ද යන බව : ........................ ................
   (ඉ) එයින් ඉටු කෙරෙන අරමුණ හෝ සිදුවන මෙහෙය : ........................... ..................

4. නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර :

   (අ) ඔහුගේ/ ඇයගේ සම්පූර්ණ නම : .................................................... .......................
   (ආ) ඔහු/ඇය පදිංචි ලිපිනය : ......................... ......................... ..........................
   (ඇ) උපන් දිනය: ......................... ......................... .........................
   (ඈ) ජාතික හැඳුනුම්පත් අංකය: ......................... .......................... ..................
   (ඉ) දුරකථන අංකය:......................... ......................... ..........................
   (ඊ) ඔහු/ඇය පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? ........................ .................
   (උ) ඔහු / ඇය එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? ......................... .......................... ...............
   (ඌ) ඔහු /ඇය රාජ්‍ය නිලධාරියෙකු ද? එසේනම් ඔහු දරන තනතුර සඳහන් කරන්න. :......................... .......................... ..........................

5. අදාළ මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය ඔහුගේ/ඇයගේ නාමයෝජනාවට අවසර දෙමින් යෝජනාවක් සම්මත කර ඇද්ද? එසේනම් එම යෝජනා සම්මතයේ දිනය සඳහන් කරන්න. ......................... ......................... ..........................

6. මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ නිර්දේශය ඊට හේතු ද සමග සඳහන් කරන්න.
   ......................... ......................... ..........................

.............................
ලේකම්
(මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ මුද්‍රාව)

දිනය : ..............................

## 'ඇ' ආකෘති පත්‍රය

(නාමයෝජනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් විසින් පිරවිය යුතුය.)

1. සමථ මණ්ඩල ප්‍රදේශය : .......................... ..............................
2. පරිපාලන දිස්ත්‍රික්කය : ........................................................
3. නාමයෝජනාව ඉදිරිපත් කරන දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් පිළිබඳ විස්තර :
   (අ) ඔබගේ සම්පූර්ණ නම : ......................... .......................... ..................
   (ආ) ඔබගේ රාජකාරි ලිපිනය : ......................... ............................................

(ඈ) ඔබ දිස්ත්‍රික් ලේකම්ව සිටින්නේ කුමන දිස්ත්‍රික්කයක ද? : .......................................

(ඈ) ඔබ ප්‍රාදේශීය ලේකම්ව සිටින්නේ කුමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද ? : .......................................

4. නාම යෝජනා කරනු ලබන නිලධාරියාගේ විස්තර :

(අ) ඔහුගේ/ ඇයගේ සම්පූර්ණ නම : ......................... .......................... ...................

(ආ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙක් ද? එසේනම් ඔහු/ඇය දරන තනතුර සඳහන් කරන්න. :
......................... ......................... .........................

(ඇ) උපන් දිනයඃ ......................... ......................... ..........................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකයඃ ......................... .......................... ..................

(ඉ) දුරකථන අංකයඃ......................... ......................... ..........................

(ඊ) ඔහුගේ/ ඇයගේ රාජකාරි ලිපිනය/පෞද්ගලික ලිපිනය : ....................... .................... ..

5. ඔබගේ නිර්දේශය සහ ඊට හේතු ද සහිතව සඳහන් කරන්න.
.....................................................................................................................

.............................
අත්සන
(මුද්‍රාව තිබේනම්)

දිනය : ...............................

EOG 02 – 0039